**ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 216 - සමාජ සේවා දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ

නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේදයට යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 3.3 (අ) | භාණ්ඩ සමීක්ෂණයේදී අනාවරණය වූ අතිරික්තතා හා ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 3.2 (ඇ) |
| 3.6 (ඉ) | ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමට කටයුතු කර ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් රජයේ ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. | 1.6.1(අ) සහ (ආ) |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාල මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වෘත්තීය පුහුණු ආයතන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා දෙපාර්තමේන්තුවට පරිත්‍යාග වශයෙන් ලැබුණු අක්කර 33 ක පමණ වර්ග ප්‍රමාණයකින් යුත් ඉඩම් 05 ක් පරිත්‍යාග කර වර්ෂ 10 කට වැඩි කාලයක් ඉකුත් වී තිබුණ ද, එකී ඉඩම්වල හා එහි ඉදිකර තිබුණු ගොඩනැගිලි වල වටිනාකම තක්සේරු කර ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වත්තේගම ඉඩම ගිණුම්ගත කර අවසන්ව ඇති අතර සීදූව වෘත්තීය පුහුණු ආයතනය පිහිටි මුල් ඉඩමෙන් කොටසක් ජාතික සමාජ සංවර්ධන ආයතනය වෙත ගිවිසුමක් මගින් පවරා දීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් විභාග වන බැවින් එම කටයුතු අවසන් වූ පසුව සීදූව ඉඩමේ තක්සේරු වටිනාකම ලබා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි.<br>එසේම පවරාගෙන අවසන් අනෙකුත් ඉඩම් 07 ට අදාල තක්සේරු වටිනාකම් ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අදාල ලිපි ලේඛන යොමු කර ඇත. | ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය පවරා ගෙන වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | වෘත්තීය පුහුණු ආයතන 11 ක ස්ථාපිත කර තිබුණු ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබීම හා වටිනාකම තක්සේරු කර නොතිබූ අතර ඉකුත් වර්ෂ 10 කට වැඩි කාලයක් තුල ඉදිකර තිබුණු ගොඩනැගිලි පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් වල ගොඩනැගිලි හා ඉදිකිරීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | වත්තේගම ඉඩම ගිණුම්ගත කර අවසන්ව ඇති අතර සීදූව වෘත්තීය පුහුණු ආයතනය පිහිටි මුල් ඉඩමෙන් කොටසක් ජාතික සමාජ සංවර්ධන ආයතනය වෙත ගිවිසුමක් මගින් පවරා දීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් විභාග වන බැවින් එම කටයුතු අවසන් වූ පසුව සීදූව ඉඩමේ තක්සේරු වටිනාකම ලබා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි.<br>එසේම පවරාගෙන අවසන් අනෙකුත් ඉඩම් 07 ට අදාල තක්සේරු වටිනාකම් ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත අදාල ලිපි ලේඛන යොමු කර ඇත. | ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය පවරා ගෙන වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 214 රෙගුලාසි ප්‍රකාරව බලය දෙන නිලධාරීන් මෙන්ම සහතික කරන නිලධාරීන් විසින් බැරකම් පිළිබඳ ලේඛන නිතිපතා පරීක්ෂා කල යුතු වුවත් එසේ පරීක්ෂා කිරීමකින් තොරව අදාල බැරකම් සඳහා ඉදිරි වර්ෂයේදී ගෙවීම් කරන අවස්ථාවේදී බැරකම් ලේඛනයේ සටහන් කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. මේ අනුව මු.රෙ විධිවිධාන ප්‍රකාරව බැරකම් ලේඛනය පවත්වා ගැනීම තුලින් බැරකම් පිළිබඳ පාලනය ක්‍රියාත්මක වී නොතිබුණි. | පාලනය කල නොහැකි අත්‍යවශ්‍ය වියදම් මෙසේ බැරකම් ලේඛනයේ සටහන් කිරීමෙන් අනතුරුව ගෙවීම් කරනු ලබන අතර කෙසේ වෙතත් 2023 වර්ෂයේ සිට බැරකම් ගෙවීම් ඉතා පාලනයකින් යුක්තව ගෙවීම් කිරීමට අදාල අංශ දැනුවත් කිරීමට පියවර ගත් බව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(ඇ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව යම් මුදල් වර්ෂයකට අදාල සියලුම බැරකම් එම වර්ෂය තුලදී නිදහස් කළයුතු අතර කිසිඳු බැරකමක් ඊලඟ වර්ෂය තුල නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙනයාමට කටයුතු නොකළ යුතු බව උපදෙස් දී තිබුණ ද, එසේ ගෙවා නිදහස් නොකළ වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා කාලයක් ඉකුත් වූ වැය විෂයයන් 19 කට අදාලව රු.5,045,397 ක් වූ බැරකම් පැවතිණි. | අදාල ආයතන විසින් ඉහත බැරකම් ගෙවීම් කිරීම සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කර නොමැති බැවින් එය දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් විමසීම් කොට ඉදිරියේදී අදාල බැරකම් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.2 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2022 මූල්‍ය ප්‍රකාශනයෙහි පිටු අංක 3හි මේ පිළිබඳව පැහැදිලිව සඳහන් කර දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සපලදායී පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන් දීමේ නිළධාරි හා ගණන් දීමේ නිලධාරි සහතික වී ඇත. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | | රු. | | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 880 සහ 612 වැනි අධිකාරිය යටතේ වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනත | | ඇප තැබිය යුතු නිලධාරීන් 40 දෙනා අතරින් නිලධාරීන් 16 දෙනෙකු පමණක් ඇප තැන්පත් කර තිබුණි. ඉතිරි නිලධාරීන් 24 දෙනාගෙන් ඇප තැන්පත් භාර ගැනීම දීර්ඝ කාලයක ප්‍රමාදයක් පැවතුණි. | රා.ප.ව. 07/2019 අනුව අනෙක් ඇප තැබීමේ ක්‍රමය අනුව ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමක් ආරම්භ කොට මාස 03 ක් ඇතුළත සම්පූර්ණ ඇප මුදල තැම්පත් කිරීමට කටයුතු කළ යුතු බව අදාල නිලධාරීන් වෙත දන්වා යවා ඇත. | ඇප ආඥා පනත සහ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ii) | 2016 පෙබරවාරි 10 දිනැති අංක ඩීඑම්ඒ/එච්ටී/2015/01 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.2 ඡේදය | | දෙපාර්තමේන්තුවේ වාහන පිළිබඳව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 05ක කාලය තුලදී වාර්ෂික භෞතික සමීක්ෂණ කටයුතු සිදුකිරීමට කටයුතු කර නොතිබුණි. | සියළු වෘත්තීය පුහුණු ආයතන භාර නිළධාරීන් වෙත, ආයතනය සතු වාහන, භාණ්ඩ සමීක්ෂණයට ඉදිරිපත් කරන ලෙසට ලිඛිතව උපදෙස් ලබා දී තිබුණද මෙම ආයතන වල භාණ්ඩ සමීක්ෂණ වාර්තා අතරින් කැටවල හා ප්‍රධාන කාර්යාලයේ සමීක්ෂණ වාර්තා වල වාහන භෞතික පරීක්ෂාවක් කල බවට සටහන් කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 2.4 අවිධිමත් ගනුදෙනු

**අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

දෙපාර්තමේන්තුව විසින් අධිකාරී බලය නොමැතිව පහත සඳහන් ගනුදෙනු කර තිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1 ඡේදයෙන් අනුමත නිලධාරීන් හට මසකට රු.1000 ක උපරිමයකට යටත්ව දුරකතන බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමට උපදෙස් ලබාදී තිබුණ ද, ඊට පටහැනිව අධ්‍යක්ෂවරයාගේ අභිමතය පරිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල අනුයුක්තව සේවය කරන දෙපාර්තමේන්තුවේ සමාජ සේවා නිලධාරීන්ට හා සංවර්ධන නිලධාරීන්ට මාසිකව දුරකතන දීමනාවක් ලෙස රු.1000ක මුදලක් 2020 සැප්තැම්බර් සිට ගෙවා තිබුණි. ඒ අනුව සමාජ සේවා නිලධාරීන් 872 දෙනෙකු සඳහා 2020 සැප්තැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා කාලය තුල එකතුව රු.8,086,403 ක් වූ දුරකතන දීමනා ගෙවීම සඳහා විධිමත් අධිකාර බලයක් ලැබී නොතිබුණි. | සමාජ සේවා නිලධාරින්, සංවර්ධන නිලධාරින් වෙතද දීමනාව ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කල අතර ඒ සඳහා 2021 මාර්තු 16 දිනැතිව අදාල දීමනාව ලබා දීමටත් එය වැටුපට ගෙවීමටත් අනුමැතියත් ලබා දී ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික අයවැය ප්‍රතිපාදන උපයෝජනය වන ආකාරයද සඳහන් කරමින් 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර පිළියෙල කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, 2022 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට පිළියෙල කිරීමට හා ඊට අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට පිළියෙල කර අනුමැතිය ලබා ගැනීමට නොහැකි වූ බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර අදාළ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආබාධ සහිත පුද්ගලයන්ගේ දැනුමෙන් හා කුසලතා වලින් සවිබල ගැන්වීමේ අරමුණින් ආරම්භ කර තිබුණු ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහන යටතේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. නමුත් මෙම ක්‍රියාකාරකම මානව සම්පත් සංවර්ධන සැලැස්මට අන්තර්ගත නොකොට ප්‍රජා මූලික පුනරුත්ථාපන ජාතික වැඩසටහනට ඇතුළත් කර එහි ප්‍රතිපාදන වලින් රු.760,000ක වියදමක් දරා නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. මෙම වැඩසටහන යටතේ ස්වශක්ති කණ්ඩායම් වල නිෂ්පාදන | රටේ පැවති මූල්‍ය අර්බුදය හේතුවෙන් සෙසු දිස්ත්‍රික්කයන්වල මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. ආබාධ සහිත පුද්ගලයන්ගේ නිෂ්පාදන දිරිගැන්වීම සඳහා "දිරිය නිෂ්පාදන" නමින වෙළඳ ලකුණ භාවිතා කිරීම සඳහා අවශ්‍ය කටයුතු කර ඇති අතර,ඒ සඳහා දිරිය ලාංඡනය ලියාපදිංචිය ආරම්භ කර ඇත. ආබාධ සහිත පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීමේ අරමුණින් ආරම්භ කර තිබුණු ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත දැනටමත් මෙහෙයුම් කමිටු සක්‍රීය කිරීම සඳහා උපදෙස් ලබාදී ඇති අතර, ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉදිරියේදී මෙහෙයුම් කමිටු සාර්ථකව පැවැත්වීමට කටයුතු කරන බව. | සැලසුම්ගත අරමුණු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායි ලෙස ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| අලෙවි ප්‍රදර්ශනයක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද නිෂ්පාදන සඳහා ලාංඡනයක් හඳුන්වාදීම හා ලියාපදිංචිය සිදු කිරීම පමණක් ඉටු කිරීම තුළින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගෙන නොතිබුණි. තවද ප්‍රජා මූලික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂයට රු.10,500,000ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණ ද , ඉන් රු.6,540,000ක් පමණක් උපයෝජනය කර තිබුණි. | | |

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවුරුදු 14-30 වයසේ පසුවන තරුණ, තරුණියන්ගේ ඉදිරි වෘත්තීය පුහුණු කටයුතු සඳහා පූර්ව සූදානම් කිරීම වෙනුවෙන් ආරම්භ කර තිබුණු කොට්ටාව කුසලතා සංවර්ධන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේදී සම්පූර්ණ කර තිබුණ ද , එහි පුහුණු කටයුතු සමාලෝචිත වර්ෂයේදීද ආරම්භ වී නොතිබුණි. | අවු 14-30 වයසේ පසුවන එම මධ්‍යස්ථානයේ සිටි දරුවන්ගෙන් සුදුසු සේවාලාභීන් කොට්ටාව ආයතනය සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් අනතුරුව තෝරා ගැනිමට සිදු වීම නිසා ඒ සඳහා යම් කාලයක් ගත වීම හා ආයතනය සඳහා නියමිත කාර්ය මණ්ඩලය පත්කර ගැනිමට ප්‍රමාද විය. | වත්කම් ඵලදායි ලෙස හා අදාල අරමුණුගත කාර්යයන් සඳහා භාවිතා කිරිමට කටයුතු කල යුතුය. |

**3.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍ර ලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ දැක්ම අනුව 2030 වර්ෂය වන විට ඉලක්කගත ප්‍රජාවගේ අයිතිවාසිකම් හා සමානාත්මතාවය තහවුරු කිරීම සඳහා වූ අපේක්ෂිත ඉලක්කය | කාර්ය සාධන වාර්තාවේ දෙවන පරිච්ඡේදය තුළ මෙම වැඩසටහන් තුළින් අත්කරගත් ප්‍රගතිය දක්වා ඇත. | චක්‍රලේඛය මඟින් දී ඇති උපදෙස් ප්‍රකාරව කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වෙත ලබාවීමේ ප්‍රගතිය කාර්යසාධන වාර්තාවේ ඇතුලත් කර නොතිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකාවේ වර්තමානයේ ආන්තිකරණයට හා අවාසි සහගත තත්ත්වයට පත් ප්‍රජාවගේ ස්වභාවය, ප්‍රමාණය හා ඔවුන් භූගෝලීය වශයෙන් විසිරීම පිළිබඳ සංඛ්‍යාලේඛන, වාර්ෂිකව ඊට අලුතින් එකතුවන ප්‍රමාණයන් පිළිබඳ ඇස්තමේන්තුගත දත්ත, දෙපාර්තමේන්තුව හා අනෙකුත් ආයතන විසින් වාර්ෂිකව සවිබලගන්වනු ලබන ප්‍රජාව පිළිබඳ සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන, දත්ත හා තොරතුරු විශ්ලේෂණාත්මකව කාර්යසාධන වාර්තාවේ ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි. | 2023 වර්ෂයේ සමාජ සේවා දෙපාර්තමේන්තුව හා රාජ්‍ය නොවන සංවිධානයක සම්බන්ධීකරණය යටතේ දිවයින පුරා විසිරී සිටින ආබාධ සහිත පුද්ගලයන්ගේ දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව. | කාර්යසාධන වාර්තාවට සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන, දත්ත හා තොරතුරු ඉදිරිපත් කිරිමට කටයුතු කල යුතුය. |

## 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2023 මාර්තු 31 දින වනවිට ඉටුකර තිබුණ ද, මු.රෙ.760 විධිවිධාන ප්‍රකාරව 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් ඌනතා, අතිරික්තතා හා අපහරණයන් පිළිබඳව සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ පරිදි කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි. තවද. බටුගම්මන වෘත්තීය පුහුණු ආයතනයේ බඩු වට්ටෝරු පොත් සහ භාණ්ඩ නිසි පරිදි නඩත්තු නොවන බැවින් 2022 භාණ්ඩ සමීක්ෂණය සිදු කර නොතිබුණි. | ගබඩා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල විසින් පෙන්වා දුන් අතිරික්තතා පොත් වලට ඇතුලත් කර ගන්නා ලෙස අතිරික්ත භාණ්ඩ හමු වූ ආයතනයක් වෙත උපදෙස් ලබා දී ඇත.<br>ඌනතා සඳහන් වූ ආයතන වෙත ඌනතාවයන්ට හේතු ලෙස පොත් වලින් කපා ඉවත් කර නොමැති නිසාත් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ එකම භාණ්ඩය දෙතැනක සඳහන් වීම නිසා ඌනතාවයක් ලෙස සඳහන් වන බවත්,<br>ඌනතා ලෙස සඳහන් වූ භාණ්ඩ නැවත ආයතන තුල පරීක්ෂා කිරීමේදී සොයා ගැනීමට හැකි වූ බවත් ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ශේෂ කිරීම් දෝශ සහිත බව සහ ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීන කර නොමැති බැවින් සමීක්ෂණ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. | ඌණතා හා අතිරික්තතා සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1956 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වර්ෂ 65ක කාලය තුල ස්ථාපිත කර තිබුණු වෘත්තීය පුහුණු ආයතන, පුනරුත්ථාපන මධ්‍යස්ථාන හා මාර්ගෝපදේශන මධ්‍යස්ථාන 14 ක ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය පවරා ගෙන නොතිබුණි. පසුගිය වර්ෂයේදී විගණනයෙන් පෙන්වා දුන් පරිදි විධිමත් ලෙස නීත්‍යානුකූල අයිතිය පවරා ගැනීමෙන් තොරව ගොඩනැගිලි ඉදිකිරීම් හා වැඩිදියුණු කිරීම් කටයුතු සඳහා ඉකුත් වර්ෂ 05 කාලය තුල රු.මිලියන 500කට අධික මුදලක් වැයකර තිබුණි. | ඉඩම් 09 ක් මේ වන විට විධිමත් පරිදි පවරා ගැනීමේ කටයුතු අවසන් කර ඇති අතර ඉතිරි ඉඩම් වලින් ආයතන 04 ක ඉඩම් කොටස් , ඉඩම් අමාත්‍යාංශය හා අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සම්බන්ධ වී සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත විධිමත් පරිදි පවරා දීමේ කටයුතු ආරම්භ කර ඇත. තවද, දෙපාර්තමේන්තුව වෙත ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමේදී බාහිර පාර්ශවයන්/ආයතන සමඟ සම්බන්ධ වී දීර්ඝ ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු බැවින් ඉතිරි ඉඩම් පවරා ගැනීම සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින අතර එම ඉඩම් නීත්‍යානුකූල ලෙස පවරා ගැනීමෙන් අනතුරුව තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරවාගෙන ගිණුම්ගත කිරීමට කටයතු කරනු ඇත. | දේපල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතු අතර චක්‍රලේඛ හා මාර්ගෝපදේශ ප්‍රකාරව වත්කම් කළමණාකරණය කල යුතුය. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත කාර්යය මණ්ඩලයේ නොවන සංවර්ධන නිලධාරී (සමාජ සේවා) තනතුරු සඳහා ඉකුත් වර්ෂ වල බඳවාගෙන තිබුණු සංවර්ධන නිලධාරීන් 196 දෙනෙකු සමාජ සේවා නිලධාරී තනතුරු වල රාජකාරී ඉටුකරන තත්ත්වය තුල වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී විෂය රාජකාරී සඳහා තවත් සංවර්ධන නිලධාරීන් 306 දෙනෙකු බඳවාගෙන එම තනතුරු අනුමත කාර්යය මණ්ඩලයේ නොමැති වීම මත සමාජ සේවා නිලධාරී විෂය රාජකාරී සඳහාම නැවත පත්වීම් ලබාදී තිබුණි. මේ හේතුවෙන් 480 ක් වූ සමාජ සේවා නිලධාරී අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා | ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය යටතේ වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරී විෂය රාජකාරි සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුව වෙත විටින් විට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර තිබූ අතර මෙම නිලධාරීන් සඳහා ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂගේ එකඟතාවය සහිතව වැඩිහිටි විෂය රාජකාරී සඳහා රාජකාරී ලැයිස්තුවක් නිකුත් කර ඇත. ඒ අනුව මෙම නිලධාරීන් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ විෂය රාජකාරී සිදු කරන අතර සමාජ සේවා දෙපාර්තමේන්තු නිලධාරියෙකු නොමැති සේවා ස්ථාන වල පමණක් මෙම නිලධාරීන් සමාජ සේවා විෂය රාජකාරී ආවරණය කරයි. | අනුමත කාර්ය මණ්ඩල සංශෝධනය කර ගැනීමට කටයුතු කල යුතුය. |

502 දෙනෙකුගේ සේවක අතිරික්තයක් නිරීක්ෂණය විය. කෙසේ වෙතත් රජයේ ප්‍රතිපත්ති හා තීරණ මත සංවර්ධන නිලධාරීන් බඳවාගැනීම් සිදුකළේනම් අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කර ගැනීම කළයුතුව තිබුණත් එසේ කටයුතු කර නොතිබුණි.

සමාජ සේවා දෙපාර්මේන්තු ස්ථිර කාර්ය මණ්ඩලයට එම සංවර්ධන නිලධාරී තනතුරු අනුමත කර ගැනීම සඳහා සමාජ සේවා අධ්‍යක්ෂ විසින් අවස්ථා කිහිපයකදී මු.රේ. 71 අයදුම්පතක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.